# වන සැවුල් හස්න

හෙවත්

# වන කුක්කුට සන්දේශය.

රයිගම් කෝරළේ කනේවල

වෛද්‍යාචාර්‍ය ඞී. පී. විජේරත්න විසින්

විරචිත යි.

විද්‍යෝදය පරිවෙනාධිශ්වර පූජ්‍යාචාර්‍ය

හික්කඩුවේ ශ්‍රී සුමංගල මහානායක ස්ථවිර ස්වාමිපාදයන්

වහන්සේ විසින්

ප්‍ර ති ග්‍ර හි ත යි.

පෑලියගොඩ

ආර්. හර්මානිස් ප්‍රනාන්දු

යන මා විසින්

ලක්සිළුමිණ යන්ත්‍රාලයෙහි

මුද්‍රාඞ්කණ කරවන ලදී.

ශ්‍රී. බු. ව 2449.

ක්‍රි. ව 1905.

# ප්‍රකාශ පත්‍රය.

ශ්‍රී භගවතෙහිතෙ සර්වඥ සිඬායනමඃ.

මේ ව්‍යාඝ්‍රී වනසැව්ලෙකු දූත ක්‍රියායෙහි යොදා කළහෙයින් අභෙදොපචාරයෙන් වනසැවුල් හස්න හෙවත් වනකුක්කුට සන්දේශය නම්වෙයි. හෙද මොණර සැළලිහිණි ආදී සන්දෙශ නයින් දතයුතුයි; තවද ඞී. පී. ගුණවර්ධනාභිධාන මුහන්දිරම් මන්ත්‍රීන්ද්‍රයා හා දෙන් මානුවෙල් සෙට්ඨිනායකාභිධාන මුදලි මන්ත්‍රීශ්වරයාද යන උභය මන්ත්‍රීන් සකලාභිෂ්ට සම්පත්තීන් යුක්තකොට චිරායුෂ්කකර වනුසඳහා පෙරදිග ලංකාවෙහි සුමණ නමැති ශෛලශෘඞ්ගයෙහි සුප්‍රතිෂ්ඨිත සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාද ලාංඡන සංරක්ෂණයෙහි නියුක්ත සපරගමු දෙවාලයෙහි දිව්‍යමය තෙජොබල පරාක්‍රමාන්විත සුමණ දිව්‍ය රාජයා කෙරෙහි යාච්ඤාකොට කරණලද්දේය; මෙය රචනා කරණ අප විසිනුදු ස්වදෙශීය පූර්වාචාර්යයන් විසින් ව්‍යවහාරකරණ ලද ආශිර්වාද මුඛයෙන් ආරම්භ කළත් හැර දූතප්‍රයාන ප්‍රස්ථිතස්ථානයවූ ලංකාද්වීපයෙහි මෙකල අග්‍රරාජධානියවූ "කොළඹ" නගරාඞ්ගසඞ්ගිතව වර්ණනාකොට ගමනාරම්භය පිණිස සුභ නක්ෂත්‍ර මුහුර්ත දැක්වීමෙන් හා නෛමිත්ත ලක්ෂණ දැක්වීමෙන්ද ඉන් ඔබ්බෙහි සපරගමු දෙවාලය දක්වා ඇති මාර්ගය පිළිබඳ ගඞ්ගා ග්‍රාමාදීන්ගේ වර්ණනාචාර සඞ්ඛ්‍යාත සඞ්කෙතයෙන් යායුතු මාර්ගය හැඳින්වීමද අනතුරුව සුමණ දිව්‍යරාජයන් අභිමුඛයෙහි කියයුතු වාර්තා කථනය හා කීපවාරයක්ම යථොක්ත දිව්‍ය රාජයාහට ප්‍රණතාදරයෙන් ආරොචනය පිණිසද එසේම අනුචර දෙවියන්ටත් තත් ප්‍රවෘත්තීම ප්‍රකාශකරවසිද නියෝගකොට කව්එකසිය සත්තිසකින් මෙම වනසැවුල් හස්න නිමවන ලද්දේය; තදනන්තරව දූතයාහට ආශිංසනය රචනාකළ වර්ෂමාසාදිය එය කිරීමෙහි ආරාධනාය කර්තෘගේ ගෞත්‍රය ශාස්ත්‍ර විඥානය හා නාමය යනමේ ප්‍රකාශවන අතිරික්ත කව් තුනෙක්ද වේ.

තවද වර්තමාන කාලයෙහි රුචිරාමල කීර්ති දෙහාවශිෂ්ටවූ ස ව්‍යාකරණ භාෂාන්තරයන්හි විශිෂ්ටඥනය කාව්‍යරචනාවෙහි හා ආයුර්වේද ශාස්ත්‍රයෙහිද තච්චිකිත්සා ශාස්ත්‍රයෙහිද අතිශය සමර්ථතාවය බුද්ධාගම පිළිබඳ යහපත් දැනීමය එසේම තම දැනීමට උචිත ප්‍රවෘත්තින් යුක්තබවය යනාදී අනන්ත සත් ගුණයෙන් උපලක්ෂිතවූ අපාචාර්‍ය තේනාහන්දි කුමාර වෛද්‍ය මානුවෙල්ද සිල්වා පණ්ඩිත වෙද තුමන් මේ ප්‍රස්තාවෙහිලා තද්ගුණානුස්මෘතීන් සිහිපත් කරමු; අනතුරුවද අපාචාර්‍යොත්තමයන්ගේ ස්වර්ග ප්‍රාප්තියෙන් පශ්චාත් කාලයෙහි රචනාකරණලද මේ පිළිබඳව ඒ තුමන්ගෙන් ලැබියයුතු සදුපදෙශ ප්‍රාප්තියෙහි ශෝක ප්‍රාප්තවෙමු.

මෙම මතුද යථොක්ත නූතන දූත කාව්‍යය ශ්‍රීපාදස්ථානය ගාළු කෝරළය මාතරට සියළු නව කෝරළය යන මෙහි සඞ්ඝනායක විද්‍යොදය පරිවෙනාධිශ්වර සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය මාහිමියන් වහන්සේහට ප්‍රණතාදර පූර්වකව පිළිගන්වන ලදින් එසේ පිළිගෙණ වදාරණ ලද මාහිමියන් වහන්සේ

එහි ඇතැම් කවීහි ශේෂ දෝෂ සංශෝධනය කොට මධුර මනෝහර කාව්‍යයකැයි දෙවාවදාරණලද ශ්‍රී සන්නස් පත්‍රයක් සහිතව නැවත අපවෙත පොත දුන්බව ග්‍රන්ථ ගෞරවය එළිවනු සඳහා යථෝක්ත මාහිමියන්වහන්සේගේ ශ්‍රී චරණානුස්මරණපුරස්සරව සඳහන්කරමු. යථෝක්ත ශ්‍රී සන්නස මෙසේයි;

" සතුති පෙරදැරිකොට නිවේදනය කරම්හ.

අප වෙත එවනලද වන සැවුල් හස්ය බැළුවෙමු. එය මධුර මනෝහර කාව්‍යයක් බැව් කියම්හ.

මේ බවට, ශ්‍රී සුමඞ්ගලාභිධාන
ප්‍රධාන නායක ස්ථවිරයෝය.
*H. Sumangala.*

1904 සැප්තැම්බර් 10 වෙනි දින දීය."

තවද පරාර්ථ සාධනයෙහි නිත්‍යාසක්තවූ සුධීන් විසින් මේ සඳහා කරණලද ගුණ දෝෂ විභාගයම ප්‍රමාණ නමුදු පරගුණ මාත්සර්‍ය්‍යයන් විසින් කරණලද දෝෂාදෝෂ විභාගය ප්‍රමාණ නොවේ.

" ආක්‍රාන්තෙව මහොපලෙන මුනිනාශප්තෙව දූර්වා සසා
සාතත්‍යං වත මුද්‍රිතෙව ජතුනානීතෙව මූර්ඡාං විෂෛඃ
බද්ධෙවාතනු රජ්ජුභිඃ පරගුණාවක්තුං නශක්තාසති
ජිහ්වාලොහ ශලාකයාඛල මුඛෙ විද්ධෙව සංලක්ෂ්‍යතෙ "

| කවියේ ඉලක්කම | මුල්රචනාව | ශුද්ධකිරීම නා: හා: | කවියේ ඉලක්කම | මුල්රචනාව | ශුද්ධකිරීම නා: හා: |
|---|---|---|---|---|---|
| 7 | සබර; | සපර, | 79 | කළන; | කලණ |
| 12 | වැඹ; | වැම්, | 107 | දෙඩන් පෙන්; | දෙඩම් පෙන්, |
| 23 | මන්මත්; | මංමං, | 108 | දනිං; | දනින් |
| 24 | සෙබලෝ; | සෙබළෝ, | ,, | යෙහෙං; | යෙහෙන් |
| 26 | වැව; | සර, | 78 | පහං, | පහන් |
| 77 | සකියනිවඩින; | සකියදවඩන | ,, | කහං | කහන් |
| 78 | මණරම්; | මනරම්, | 112 | මෙතැන; | එතැන |
| ,, | යානෙන; | යාණෙන, | 130 | නිතින්; | නැණින් |

මිට, *D. P. Wijeratna*

මෙම සන්දෙශ කර්තෘගෙන් ලබනලද ප්‍රේරණය ඇතිව මෙසේ අච්චුනස්වා ප්‍රසිද්ධ කරණ මෙය නැවත අච්චුනැස්වීමද ග්‍රන්ථ කර්තෘගේ අවසරයෙන්ම කටයුතු බවද මෙහි හ්‍රස්ව වියයුතු තැන් දීර්ඝවීමෙන්ද දීර්ඝවියයුතු තැන් හ්‍රස්වවීමෙන් හා දන්තජ මූර්ධජාදි වශයෙන්ද අච්චුනැසීමෙන් විනිබඳන ඇතැම් අශුද්ධ ස්ථාන නිරුත්සාහයෙන් තේරුම් ගතහැකි බැවින් ඒව ශුද්ධියක් නොලිබව හා 20 වෙනි 95 වෙනි කවිවල 'විරන්, දන" යනතැන් " රවින්, දසන" කියාද සැල කිය යුතුයි.

මේ වගට,

*R. H. Fernando,*

# වන සැව්ලල් හස්න.

1 සැරද රත් පැහැගත-රත් වන් ලපිනි රදනා
සුරත් වන් යුග පිය-පබළෙව් වන සැවුල් සඳ

2 තුඟු සිරිනි ඔද්දන-තොප හිසැ සුසැදි මනරම්
රත් වන් රුවන මුතුරැඳි විසිතුරු ලක ළ
එක්වන් කිරුළු නිරතුරු බබලුසි නිව ල

අවටින් සුරත් මැද-සුදුලපිනි හෙබිළෙල සිළු
වෙසෙසින් ඉඳගුරු සුමිතුරු සිය සියො තුන ට
මෙලසින් මෙතොප එන බව පැවසිද සතු ට

මනනද කරණ තුඟු රුසිරෙන් දිලි නිව ල
එන සඳ අනරමග බිය සතුරු ඔලුමෝ ල
නොලදිද අනිටු උවදුරු සිතට විය වු ල
සැපලෙද අයිදමා සකිසඳ වනසැවු ළ

3 බමර සැලලිහිණි පරපුටු සහ මොණ ර
හිසර පරවි සුව ඇ මෙම සියොත් බ ර
බැහැර යවා වෙහෙසුවෙන් කිවිදුපෙ ර
මෙවර තොපට යහපති සකි මෙම යතු ර

4 සොබන මිතුරු ගුණයෙන් හැම්සඳ තෙව් න
රුවන මිතුරුවැනි මන මැදුරත දිලෙ න
කලණ මිතුරු දුටුසඳ සතුටු මා ම න
කිරණ මිතුරු වැද නද වැනි තඹුරුව න

5 තෙව්කුම් යස තෙදැති මහසෙන් සුරිඳු ස ඳ
මනරම් සිය අතින් දැරිසොඳ මෙතොප ද ඳ
මෙම තුම් ගුණැති ලෙව්තුල පතළ හැම ස ද
සැපතම් කිමද තොප දැකුමට වැඩි සබ ඳ

6 දුටුවන් ඇළුම් කරවන යුතු තුඟු සිරි න
සරණින් පහරදෙන තම සතුරන් නිති න
සොබමන් මිතුරු සඳ නෙක සොඳගුණ තෙව් න
දෙසවන් ලකරකළ මැනා මා බස් බර න

7 සවණ පදකමලු සමනල ගිර රඳ නා
රකිණ ලෙව් සමග තෙදබලැති අපම නා
පැමිණ සපරගමු සුර මැදුරත දිලෙ නා
සුමණ සුරිඳුහට දෙව සකි මෙම හසු නා

8 එ බැවින් එතතු බිතුමට පළමුවෙන් න ද
සම ගින් නයන පුරසිරි මග සලකුණු ද
අමවන් මිහිරි තෙපලින් පවසමි මෙස ද
සතුටින් අසනුමැන පියකරු මා සබ ද

9 කලඹ සිරි සපිරි අලකා පුර අයු ර
ලකඹ මිත සුසැදි මිණි කිරුළ සිරිද ර
සුලබ නමැති නැව් තොට යන රුත් පව ර
කොළඹ පුරවරය දනු මා මිතුරුව ර

10 සමුදුර එවෙත මිණිමුතු රැසිනි බබල නා
නොවිතර තරඟ වැලනිති වෙරළ සැදිව නා
පුරවර සපිරි සිරි සර නැතිවන බියෙ නා
රැකවර නම යෙදූ සුදු හය රළක් ඉම නා

11 පවන වැද ලෙලෙන බඳ දද පෙළ දිමු ත
පැමිණ සිටි මුහුද පුර සල නැව් මහ ත
සරණ පුරඹගෙන් විනු වස් තමන් වෙ ත
කරණ අත් වැනුම් මත් සලෙල සිරිග ත

12 එපුර වර සුසැදි මහලින් දිලි තොම ද
පතර බිතු නගා බැඳි මැම් පෙළ පබ ද
විතර නොමැති පහ පෙල සඳලු තලබ ද
එ සුර ඇතොත් රන් ගිරි සියදහස් සො ද

13 එ පුර නැබල පහ පෙල මිත සැදි නිතො ර
ලකර දූහල නෙක දද පෙළ ලෙල කොයු ර
සැකැර සුරිඳු අබිය සැරහව දිව ස ර
නිතර පුරුදු කරණාවි රහ අඹර තු ර

14 ලකල් සිතුයමින් සැදිවම සූපැහැ ස ර
උදුල් සුරපහය පසුකර දිලි පව ර
නැපැල් එ "කන්නෝරුව" නම් පහ පත ර
මෙකල් කුමක් කියමිද ලොව උවමිකා ර

15 දෙ සේ නොයෙක් දන රස්කර තැබූ ති ල
වි සේ සමයෙන් අය වැය බලමින් සිය ල
නොඉස් නෙපබු දන රැඳි පිරිසිරි නැබ ල
කෙ සේ වණ්නනම්ද පුවතර “බැංකු” පෙ ළ

16 ප හ නොව අන්නක නොරතුරු මෙසිරිලක තු ළ
ස හ අය බදු දැන ලිපිකර තැබූ සිය ල
ම හ “කච්චේරිය” විසිතුරු කමින් ක ළ
ප හ යෙව් සුරිඳු වෙන කොඳ ඵලාව උතුම් තු ළ

17 ප බු ද න රද නීති නොකසත දත් මහ රූ
ස පැ මිණ සාඩු විසඳන ඇඳිනැ'නොරතු රූ
සන්සාබන මහ “උසාවිය” රැඳි පුරඅතු රූ
සු ර ගණ සුසැදි සුර සබ සිරිසිලි සොදු රූ

18 වැල දි කිතු සමය දන ගණ පුදකර න
සු සැදි මැම් මුදුනැ බැඳි ජේකබ සොබ න
ඔ ර දි රස්පතර සැදි කොත් පෙළ දුලු න
පැ හැදි දෙව් මැදුරැබල සකිසනි නද න

19 නත් විසිතුරු නෙකවන සිතුසම් උදු ල
නත් මිණිහඩ සහ පසතුරු ගොස වත ළ
ම ත් අපිකර පවසන තියු ගී අම ල
ස ත් තොසවම බලසකි කෝවිල් දෙම ළ

20 තරසර සිව්බිනින් නෙක ටැම්පෙළින් බ ද
පුරවර රට විරත් යොන්කැළ වින් නිබ ද
විදියුර සිය දහම්දෙව් පුදන කරන ද
මිතුර බලනුවේ පස යොන් කෝවිල් ද

21 කළ බැහැරා හැම දුසිරිත නමන් සි න
දි ග ත පුරා සුදිලෙන යස රසින් යු න
තු ර ඟ අරා යන පොහොසත් දන මහ න
මිතුරු ව රා නරඹනු සිතතොසින් යු න

22 බැ දි ද ද පල ගලල දෙන නලය වැද වැ ද
පැහැනද ලකර සිතුයම් අවචින් පබ ද
නොවමද සිනිදු නිල්තුල තොකවතිනි සො ද
හැම සද සරණ රියපෙළ විදු රැපැසි වල ද

23 රන්  වන් විලි සිඟු අඟ සරසා ලකා  ල
නන්  මිණි ගොස ගෙල බැඳි පුරතුල වන  ළ
නන්  ගොන් නොකා වග ගැල සොදමින් විපු  ළ
ම ං  මං වල කිස් නොව සරති හැමක  ල

24 වැඩි බරණින්  රත් නිල් අයුරු බිසම්  ත
දැඩි අවි ය න්  ‘දරමින් අනෙක විලසි  න
එ ඩි මඩි මින්  රැපු ජයගෙණ අනෙකා ර  ණ
රැක වරණින්  සෙබළෝ ඇත පුර සර  ණ

25 විහි දෙ න  දුම් කඳ නොසකර යතුරු න  ල
නි ම ව න  නෙකංවග දඹු ලොහොකම් නිම  ල
ර ද අ ණ  ලෙස කටයුතු ඇති සුපිළිවෙ  ල
තැනතැන  රැඳි අත්තම් හල් බල විපු  ල

26 ෂනා මින  දිය සපිරි මින් රළ සැඳි නිති  ත
රැගෙ ණ  දෙනෙතර දනදුම් ඔරුද දුව ව  න
නොමිණ  දන පැමිණ ගිම් සනහනා යෙහෙ  න
බ ල න  මැනවි බේරේනම් සර කල  න

27 ඉ දු වර  නුවන් දුල දත් කුමුදු මුවස  ර
පිය යු ර  තිසර දිගු වරලස සෙවෙල් බ  ර
පුව තර  නරඹ හසයුත් දල මෙවුල් බ  ර
හැම වර  පෙණේ කොමලඟ නෙව් පුර පොකු  ර

28 ම න්  ලෙද නුවරු නව නගරික සබා තු  ලී
පැ න්  සපයා සොදවා තැබු යුතු සිලි  ලී
තැන්  තැන්වල මග යුග පස නිති උදු  ලී
ය න්  දිය යතුරු දැක දැක සතුටින් ඉපි  ලී

29 කර ණ  යතුරු ගොස බියකරු හඬ වත  ළ
තගි ණ  දුම් විහිදී කෙස්වැටිය ගිනි සි  ල
බ මණ  රතැස් දිලි දුම්රිය රකු සුබ  ල
දු ද න  ගඟුව සොයනෙව් පිවිස පුර තු  ළ

30 නොමින  ඉසුරු පිරි සරි සුර පුර මෙපු  ර
බැ වි න  නොමැති සුරරද තුටු පඬුරු ක  ර
එ ව න  දිවරිනෙව් වේ මගෙනි පුරව  ර
දි ව න  විදුලිරිය දියිවේය මමිතු  ර

31 සල සපු ඉද්ද කොබලි ලකිනි හිරි සොබ න
ජූල බදුවද වෑකොඳ මල ඉතිද ය න
මල වල සුපිපි විහිදෙන සුවඳ අපම න
නිල් කර රැදි බිඟු පෙළ මුවරද ලොබි න

32 තුරුලිය ලෙව් ඇති නෙකවග සැදි නද න
තුරුහිස රැව් දෙන නෙක දදකැළ තුටි න
ජුටු දන සව් නෙතදුන වන මල් උය න
තාදුනුය නෙව් දිසි විය පුරවර රඳ න

33 සපැමිණ රහකරු සිය දෙස දෙස තුරෙ න
කියමින ගී සින්දු බෙර වෙණ වැයිමෙ න
වෙසෙසින පුබුදනන් මනසතුටු කරමි න
රහදෙන රඟමඩල බල මම්තුර කල න

34 මනහර ලිය මල්කම් කල බඩු සහ ස
පුවතර මිණිමුතු රණ බරණ කර රැ ස
සිටුවර යුරු ඉසුරෙන් රැදි වෙළඳ රැ ස
පුරවර දිලි සල්පිල් සකි බල සතො ස

35 ලොවැත් සියළු දේ නෙක දෙස දෙසින් ගෙ න
සැපත් කර හසර පස සැල් පුරවමි න
නොමැත් කිසි දෙයක් උනු සල්පිල් දුල න
වණත් අනත්නාම් සකහට හැකි වෙ න

36 අඹ නාරන් දෙළඹ මොරපළුද ගිවු ලිය
දඹ හැලි දඹ මීඅඹ විලිකුම් බෙ ලිය
රඹ නෙක පල තබමින් නිති කඩ පි ලිය
නුඹ බලසකි වෙළඳන් කරණ කොම් ලිය

37 සරණ හසර දෙපසෙහි රුසිරු පියො බ ඳ
නොමිණ පෙණෙන පිළි බිඹු මිණි බිතිනි සෙ ද
කළුණ සුරපුරෙනවුත් අපිකර නොම ද
දෙරණ සරණ සිරි කියලිය හැම ස ද

38 දගා තැඹිලි මල් නොපිපුනු ලෙ සේයා
ලගා වෙමින් තරුණන් කර හ සේයා
නගා මල් ගවසමින් වර ල සේයා
මගා මිතුර යනෙනා මියුලැ සේයා

39 නරඹා සිටිනා තරුණන් වෙනෙහි ලොබයෙ ණ
නරඹා හැඟුම් ඇසිපිය හෙළනා පම ණ
නරඹා නොප දෙසෙහි අපිකර තුවනයි ණ
නරඹා සිරින් සකියනි සරණ කලු ණ

40 අනත් සිරි මෙසිරිලක පැවති හැමනැ න
සැපත් කර තැබූමෙන් පිරි සිරි දූල න
මහත් මෙපුර සිරි සර වණිත වෙසෙසි න
සමත් වෙද කවර වියතක් ලොව වස න

41 තෙවලා දහම් පෙළනය සමඟ වියර ණ
ලොබලා හදරණ සහගණ මුනි සුත ණ
නි ම ලා සුසැදි විදුදය පිරිවෙණ සොබ ණ
බ බ ලා සුපුන් සඳමෙන් පුර ඔර පැමි ණ

42 ගසාදුරු අරුත් ටීකා පොත් පත් රැගෙ ණ
ගැ ඹුරු නොයෙක් තැන් සැකහැර විමස මි ණ
සු තුරු දහම් උගණිති එහි නෙක සඟ ණ
මි තුරු බලන් එදනා සිතු පිරි තුටි ණ

43 මෙ න ය පසන්වම මොක්සිරි ලබන මෙ න
තැ න ය නොයෙක අසමින් සැක පිරි සිඳ න
වි න ය දහම් පෙළරුත් සමඟව ඉගෙ ණ
පෙණෙය මිතුර තම එහි රැඳි නෙක සඟ න

44 නොහිමි සසර සැමදූක් කරණුව ඉව ර
උ තු මි පොරනැදුරු බස් නොමකර බැහැ ර
නොහිමි ගැඹුරු පදරුත් දැන සා නිනො ර
වි ජ මි පෙළ දහම් උගණිති සඟ පව ර

45 මෙ සේ හෙදෙසි නැවිදින් උගණිති සඟ ණ
එ සේ ම ගිහිදන සතු ඇස වියර ණ
නොසේ ලකර සඳ කවිනළු සඳ ලෙසි ණ
ල සේ නොවම උගණිති සකි මෙපිරිවෙ ණ

46 ප සි දු නෙදස පිරිවෙණ වෙත රැඳි සොබ න
මු නි දු දැ නිදන් කර බදවූ සුද න
පැහැදු දිලෙන වට දැගැබ යාදස න
නම දු බැතින් තුන්සිත එකඟ කරග ණ

47 ම රැ ම න් බිඳ බුදුවූන දින අප මුණි ඳු
පි ව ඳු න් සිරි මිහ බෝ පෙළ පතින් ඉ ඳු
ඳු මි ඳු න් සුපැවති එහි නිල් පැහැවිනි ඳු
බැතියෙන් හැම මුනි ගුණ සිහිකර නම ඳු

42 අනැ ඹුල් ලෙසින් දත් විනිවිද නේ මඩ ල
පැහැ දුල් සවන් කැලූමෙන් බබලන නිම ල
ද ස ඹු ල් පිළිම හිමි සඳ පිළිම ගෙයැතු ළ
එක තුල් සිතින් වැද බැසගෙණ මිතුර ය ල

49 ම න කල් දහම් පොත් තබනුව සුරැකිලෙ ද
සිතැ තුල් බැතින් කරවූ සුදන මන න ද
දෙ ම හල් යුත් පහය සුරමැඳුර සිරිල ද
සිතුලොල් වඩා යහලුව බලනු මැන සො ද

50 මි තු රු පහය වැද මදෙසුන් තුලවිඳු රූ
ඇ ඳු රු තිලොව දම් ලියවා තැබු සොඳු රූ
ම හ රු එපොත් රැසදැකැ සිතිනි කරග රූ
ල පි රූ තොසින් නොම යුහුව් කර යතු රූ

51 බු රු ම ඳෙ සි න් ගෙණවුත් දළදා පුද ව
බැ ර ම රු ව න් කම් සහ නිමවූ සොඳ ව
තිබෙන මෙ දැන් තබමින් මෙහි සුරැකිකො ව
බ ල ග ණ ර න් කරඹුව සකියනි සතු ව

52 ම හ තු න් සුමාගමැ ගරු පින්සිරි වඩ ණ
මෙ හි ව න් පිරිස සහ පත් කරඹුව රැගෙ ණ
සු ප ස න් බුරුම මහ සඟනටපින් සිති ණ
උ ව මැ න් මිතුර බල සිව්පසයෙන් කර ණ

53 ගු ණ ග ණ දළ පෙලින් ඉඳු නැණ තලිනි ඳු ල
බ බ ල න සිල් කොමින් සබවස රොණි නව ල
සි සු ග ණ බිහුන් නදදෙන මෙසිරිලක වි ල
පි බි ඳු න සරෙව් මුනි සඳ දම්රැස නිම ල

54 දෙ ස දෙස නොයෙක කිවිකැළ බස දපණ න ල
දි සි ය ස සුපිළි බිඹු සුතවරන දසඹු ල
නොව ලස බුදු සසුන් වැඩුමෙහි සියඑක ල
වි දි ලෙ ස දහම් දත් රැකිනිමල සිකපෙ ල

55 ස ත ර සමඟ විසරණ සිහල පෙළ බ ස
අ ම ර වදන සහදත් නෙක පෙදෙසබ ස
ස ත ර සඳ ලකර නිය සන තකු වෙසෙ ස
නොහැර දත් නැනැති සුරගුරුවර සදි ස

56 ගු රු දස ශිල් බස සිහ තෙල් රණබඳු ණ
සි රි සුමඟුල් මානිමි සදවැද සර ණ
නිති සුනි මල් සිත මිණිබරණින් නෙවි ණ
සිත එක තුල් කර වැද යලි මිහ සහ ණ

57 මහ හර ලෙසින් කළ ලියමල් කම් සුසැ ඳූ
පැහැබර වියන් බඳ සිතුයම් අවට රැ ඳූ
සිරි බ ර සුරන් මැදූරෙව් බබලන පසි ඳූ
ම මිතු ර ගොසින් ලකිසුරු මිදූරතට ව ඳූ

58 තෙද යස පතළ දියතුල දෙසග බටිහි ර
ර ද රුපු කිරුළු මිණිරැස් නොසිනි හැම ව ර
ප ද සර දෙවුන් කළ ගුණ ගණ මිණි අක ර
ර ද නිය අනෙනි පත් ලකරකිණුව මෙව ර

59 ත ද තෙද පතළ ලකතුළ මෙත සැඩකිර ණ
න ද කළ දන සඳ කොඳ යස අමරැසි ණ
ල ද සොඳනම් රිජ්වෙ ලකිසුරු කල ණ
වැ ද පද සර අවසර ඇරගනු යෙහෙ ණ

60 නෙක දෙස පතළ යස කිරි සිදු තරඟ බ ඳු
නොව ල ස විරිඳු ඉබු ඔද හළ මිහිඳු බ ඳු
කළ තොස තිළිණ යදිදන සිතු මිණක බ ඳු
ස හතො ස වැජඹි කුලඹර පතනි සිඳු බ ඳු

61 නැණ යෙන් ස දි ස් සුරගුරු සහ දත් කැ මැ ති
ස ල ම න් දි යෙස් බණ්ඩරනායක න මැ ති
ගුණ යෙ න් වෙසෙස් වාසල මහමුදලි මැ ති
ද කි මි න් සතොස් පද.වැඳ සමුගණු පෙ මැ ති

52 සුර ගහ ර ල ලෙ සේ යස දස දෙස ගිහි ණී
ලොව වැඩ නොවල සේ සිදුකර දෙන නොමි ණී
ස ර ස වි ස ඳ රැ සේ කතුරිඳු වෙත පැමි ණී
නම කර සි තු ලෙ සේ අවසර ගනුයෙහෙ ණී

63 නෙක් සතස වියරණ සඟ දත් මුනිඳු බ නා
නෙක් ලෙස නිතර ලොව වැඩ වැඩු මෙහි යෙදු නා
එ ක් වම පැවති සුසිරිත යස රැස දිව නා
ල ක් මිණි පහන සතුරිදු සමුගතු පෙම් නා

64 ක ව ම බසිනි පිනවන පබුදනන් හ ද
රු ව ම නෙසතදත් නැණ යස ගුණෙන් සො ද
ක ව ම කනික කතුරිදු වෙත ගොසින් සෙ ද
ස තු ම සිහිප් කිය සකි තොප ගමන් ලෙ ද

65 ද ස අ තා පතල යස සුගුණ පැනස ර
නැන යුතා දැනෙන නෙක සතර නොරතු ර
දින ප තා පහර කතුරිඳු දැක මිතු ර
තොසපතා වෙමින් පවසනු තොප යතු ර

66 කතු වර අනෙක ගුණ දැරු නැගරුක් පහ න
දින කර පහර කතුරිඳු ඈ ගුණ නද න
පැන සර නවත් ඇති මහතුන් වෙත පැමි න
ම මි තුරු තශේ මෙගමන පවසනු යෙහෙ න

67 ස ක ර දම් අනිස බැව් පානෙව් ලොව ම
නොහැර දස දිගුම් අඳුකාර දිලි රුව ම
ප න ර රැස් රැගෙණ රිවි අවර ගිර බ ම
එ ව ර ගණ අඳුරු කඳ පැතිරෙන අව ව

63 එව් ලා යතුරු රැදි පෙණෙනුව සතර දෙ ස
පා ලා විදුලෙලිය කැටිකොට තැබුවිල ස
දි ලා එලිය පුරතුළ දිලි රැ දව ස
ලෝලා වඩන සකි බල මහ පහන් ග ස

69 සි රි බ ර පුර මෙහෙසි බැඳි නම බිසෙස් කා ල
ම න හ ර මේවුල් බර මිණි රුවනින් උදු ල
කඩ ක ර විසුල විලසින් සුදිලෙන නිම ළ
ම මි තු ර බලා වේ යුග පස පහන් ශප ළ

70 නෙක සි ත්නම කළ දෙව්රම් වෙහෙර තු ල
රැ දි උ ත් න ම තුන් බෝ විසිතුරු නිමි ළ
දි ලි නි ත් න ම දුටුවන් වඩ වඩා ලො ළ
දි ප දු ත් නා ම වෙහෙරට පිවස මනක ල

71 අවසර බලා නිදිනෙණ එහි නිදෙස් තැ න
නිදි ගැට හෙලා නැගසිට අළුයම සෙදී න
තොපැමිණ මුලා සිහිකර මුනිගුණ යෙහෙ න
වඳුම නකලා තුන් බෝ තුන් සිත බැති න

72 රැසින් කකුලු සඳු පත පුස ගුරු දව ස
දිගුත් අළුකරන රිවි උදය ගිරිහි ස
රුවත් සුතුර සිහිකර සිත තබා තො ස
ගමන් යෙහෙකි යහලුව මෙපුරෙන් නොල ස

73 සුතන සහ යොවුන් ලිය පුන් කුඹු සෙමෙ ර
වරණ හය සමග වසු දෙනුද කිරිබ ර
වයන වෙණ නාදද ගොස සහ පසහ තු ර
බලන සුබ නිමිති පෙර මග මිතුරු ව ර

74 විලඹුන් තමන් රිවි සිමි දකිමින් එවි ට
බමරුන් දිමුතු මිණිහර බැඳ ගෙලහි ව ට
මෙවුලෙන් තඹර සැර සෙත කෙළි රිසින් තු ට
තොලඹින් පියාසරකර වැල්ලෙවන්න ට

75 තැන තැන සුසැදි ලමහද පොල්වතු කදි ම
යතඑන රුසිරු ලදනණ සලෙලුද බැර ම
මනපින වන එමග සිරිබලමින් නොහි ම
යනුමැන මගට බසිමින් මා මිතුරු තු ම

76 පාමින් අගය බඩු විකුණන නොයෙක ලෙ ස
දිමෙන් නෙවර යුතු යදිනාට පින් පිණි ස
සේමන් වසන වෙළඳුන් ඇති මග දෙප ස
පාමන් කඩින් යව දැකැ සල්පිල් වේසෙ ස

77 ගෙණ බෝ ගැල බඩු විකුණන පිණිස ය න
දන බෝ කැල ඇති තවරන් කම් කර න
ගුණ බෝ සල දන ගන දැහැමින් වස න
කළු බෝ විල පසුකර සකි සඳ වඩ න

78 පැරකුම් නිරිඳු සඳ මිව් බිසවුන් නම් න
මනරම් විලස කරවූ පිරිවෙණ පොර න
නොතරම් සිරිදැකුම් ඇති දැනුදු වෙසෙසි න
කරපෙම් තසිත යව සකි පැපිලියාණෙ න

79 නිත් තම අටිය වඩවන දුටු සළෙලු ලඟ ණ
නෙත් යුග සැටිය ඉඳුවර පිපි සර ළව ණ
සිත් තුළ තුටිය කෙළි රිසි නැම්වර සර ණ
රන් ඝන පිටිය අඟනන් දැක යව කල ණ

80 බෝ ගණ ගිල් අතු පතරින් සැදි සොඳු රූ
බෝ දන කැල් නම දින කර පුද පඬු රූ
බෝ මැඩ තුල් බෙල්ලන්විල රැඳි මඟ රූ
බෝ ම න කල් මිමිතුර වැඳ කර යතු රූ

81 සිරියෙන් දුල නෙක බඩු පිරු අවන්හ ල
සතොස් සිත් පිල මඟ වෙතැ ගෙණෙනපල වැ ල
ලොබයෙන් මිල විකුණන ලද ලිය කොම ල
පිලිසන් දල පසුකර සකි පියා ස ල

82 උපුල් නුවන සරවන කොඳ කැල දස න
සෙවෙල් වරල සැදි කොමලඟනෙව් දුල න
නිමල් වැවට බැස කෑස්බෑවෙහි තිබෙ න
සිලිල් සනහ ගතැසර නැස මුදෘගෙ න

83 සිහිල් සෙවනවල අතු අනමල් කැනැ තී
විසල් රුකෙක ඉඳ සැතපි ලපළු ඇ තී
තැවුල් දිනිදු උනුවන බැස එවෙත ඇ තී
නිමල් කෙතක වැද බුදිමින් ගොදුරු රැ තී

84 බලමින් නුවනනින් පා සිතැඟි යොවුන ට
කියමින් සරණ රසගී ගැහැවිය සතු ට
දකිමින් ඔවුන් වෙත කෙළි ලොබිනි නොමසි ට
එතනින් ඈලෑයන් පොල් ගස් ඕවි ට

85 වලා ඉපළ පෙණෙන අවරඹර එලි ක ර
දුලා කුසුම් යුරු තුරු පෙණෙන එමව ර
විලා වලෙහි වෙහෙරට වදිමින් මිතු ර
බලා වසර සැත පෙවත සිත බිය හැ ර

86 එනවා සිහිල් විඳැ අළුයම නොවමැ ලියේ
උනවා නිදි ගැහැට වැඳ තෙරුවන් දි ලියේ
පිනවා නොදුරු ලැබ නෑසිය සඟ තී ලියේ
යනවා යෙහෙකි සකි මිග බැස කාළඑ ලියේ

87 මුනිඳුන් දහම් විලසින් දවසම් දුර ර
තෙරුවන් වෙහෙනි ඇති තිරතුරු බැති අද ර
සුදහන් සිරිනි ලතු නොව වැජඹෙන නිත ර
කුඹුකෙන් පියාසරකර වැද තුබ අතු ර

88 පොකුණු සලකුණෙන් පෙරසිට නාමැති ල බා
වැකුණු සිරින් බබලන බුදුරැස් කල ඹා
පොකුණු විට වෙහෙර සහ එහි සිරි සසො බා
දකිනු රිසින් යනු මැන යහලුව පිය ඹා

89 තුන් බෝ සුපැහැසර සෙල මිත දිලි පව ර
තුන් සිත එකඟකර වැදගෙණ බැස එව ර
තුන් පිටකය දම් පොත් රැඳි පහ යැත ර
තුන් විටකම වදු සකි සිත සමාද ර

90 තේසත දැනෙන වියරණ සහ මුනි වද න
සේ සිත වසන රකිමින් සික දම් බැති න
ජේවන යතිඳු පදසර නමකර යෙහෙ න
මාඉත මිතුර යන් පවසා තොප ගම න

91 අබය රුවන් මැතිතුම සිරියෙන් දිවු න
දෙතු වන වත් ගම් වැසි රකිමින් වස න
කළදූටුවන් තොස සරසවි හල රඳ න
නෙසිරි මෙවන් දැකයන් මිතුර කුළුප න

92 සරණ නෙවර පබුදන නෙදෙසින් නො හිමි
කරණ අනෙක ලෙස රිසි රිසි පුද නො හිමි
පොරණ නිරිඳුකල කළ සෙලකම් නො හිමි
සොරණ වෙහෙර වැද වදු මුනි පිළිම හිමි

93 එවෙහෙර පසෙක සැදි දෙව්මැදුරත පිවි ස
නොමහැර පතළ තෙදියත තද තෙද යස ස
පුවතර සුරවරන් පාතමැදකර නො ස
අවසර රැගෙණවිත් බලුවෙන සිරි කෙලෙ ස

94 හසර දෙපස සැදි සුර පහණවී ලක ළ
විතර නොමැති නොක දෙණ සපිරි සල්පි ළ
කතර කවත් ලතුනොව සැපතින් විපු ළ
මිතුර මෙගම සිරි බලසිට මදක් ක ළ

95 ව ර ල ස   සුනිල් බැඳ පටු නලලින් හොබ   න
තන හස   යෙහෙන් වසමින් තරව බැඳ ගෙ   න
ම ද හ ස   කරණ පාමින් මුතුවැනි ද   න
මියු ලැස   කොමල බල සල්පිල් වල සර   න

96 පෙළ සැදෙ මින්   අතිනත අල්ලා උතු   න
සි න හ සෙ මින්   මිග යන්නන් ඇඟ ගැපෙ   න
රි සි වි ල සි න්   තේවතුවල වැඩම ය   න
බල වෙසෙ සින්   දුප්පත් ලද ලිය කල   න

97 උ දු රා   අල බුදින වල් ඌරන් පෙළැ   ති
ප න රා   සුපිපි මල වල තුරු පෙළින් යු   ති
නොහැරා   ගැවසි සියනෑ වලිකුකුළු ඇ   ති
ඇ දු රා   ගල මෙසිරි දැක සකියාය යු   ති

98 නන් සිරි යෙන්   යුත් පොහොසත් දන අසි   ති
පු න් නි ල මි න්   ගන කුළු සිරියෙන් පැහැ   ති
ල න් ව නැනින්   නැන සැදි තේවතු පෙනැ   ති
ඉ න් ගිරි සෙන්   යා ගනුමැන වඩා රැ   ති

90 ර ම් බා   තුරු පෙළ පෙල සැදි කැනිනව   ල
ල ම් බා   වලුබර පොල්වතු පෙන නිම   ල
පු ම් බා   ගන සර නැස රිවි මුදුන් ක   ල
න ම්බා   පාන සැනපී යාගන් ඉගි   ල

100 දු ල් ල   පවර සමනල ගිරිරද බැති   න
ලොල්ල   මුනිඳු සිරිපද පුදම මුනුදි   න
තු ල් ල   අනක දිඟුකළ ගඞුව මිණි ග   න
ඇ ල් ල   බලායව කළුගඟ වෙන දිලෙ   න

101 මොර   ක ලු හ ර   රැ රඟ අන්දර පඟ   ර
හොර   සි ය ඹ ර   අඹ දඹ මී අඹ තුව්   ර
ක ර   ස ම ද ර   නිඹ සහ වකුලද ඩෙබ   ර
තු ර   නොඅතුර   වනතුර වදුමා මීතු   ර

102 පු ලා   කුසු ම්   රොනවල සුවඳ මද න   ල
ලොලා   සිති න්   විඳ සර නැස මූදූ ය   ල
රැ ලා   රැලි න්   යන වන සැවුලිය කොම   ල
බ ලා   ඔවු න්   සහ කෙළි කෙළැ තුටිනි පි   ල

103 තුරු පතරා තු ර අ ත රා සහ සිය ඹ
ලැබ මිහු රා පල සො දුරා විලස ලො බ
රද න ගි රා තුටි නු තු රා නොව සකො බ
මෙ සිරි සරා තනෙත පුරා සකි නර ඹ

104 ස ර ණ තුරතුරේ සා මුව පෙළ පෙ ළි ය
යනෙ න තුරතුරේ මුව ගෝනුන් පෙ ළි ය
කර ණ තුරතුරේ ගොස දිවි පෙළ බ ළි ය
දෙව න තුරතුරේ නද පර පුටු නි ළි ය

105 නි ර තු රු මි වෙ ලා ය රස ලො ලා ය
පි පි තු රු හිස නි ලා ය බිඟු දැ ලා ය
ව න තු රු සි රි බ ලා ය හැරලො ලා ය
ම ම් තු රු යව් ස ලා ය පිය ස ලා ය

106 හඬි න් හ ඬ කරණ වෙනැවන වන සැවු ල
හඬි න් හ ඬ දිදි යන දිය පෙණි නව ල
ඉඩන් ගොඩ වෙනෙහි රැදි කුරුගඟ නිම ල
උඩි න් සැ ඬ පවන බියනොව යන් ඉගි ල

107 නොක දනගණ නෙදෙසින් සපැමිණ නෙතැ න
සැ ක නොවමිණි ගනු වස් වියදමිනිද න
අ ක රන්මිණි රැදි කරවන ලද නොමි න
දැ ක සකි දෙඬම්සෙන් යාගත් සිත් තුටි න

108 ද නි න් උඬ වනැඳි නොම වැසු දෙපිය යු රු
යෙහෙන් රති විලස් නොමිදන් විපිලි ස රු
ප හ න් නොකළ පිරිසරලද සලෙලැසු රු
කා හ න් ගම බලා නොම ඉදයන් මිතු රු

109 වි සි කරණ ඇසුවන් එකලෙ සා යා
ර සි කියන ගි ගැහැවිය නො සා යා
පැ සි නෙතක බැස මින අබිස සා යා
නි සි ගොදුරු බුදිමින් වෙව නො සා යා

110 ප ව ර දෙව් පුද ම නොක පුදු පඹුරු මෙග න
නිතර පිරිස තු ට දන හැසිරෙණ නොමි න
ප තර සි රි අම ට සැදි දුට ලොල වඩ න
ස පර ගමු තුරට වදු සකිසනි තුටි න

111 රත්න ක රය සැදියෙන් නම නම ඇසි රූ
රත්න මෙතන දිසි ලකහන කොඩල සැ රූ
රත්න රැ සය සහ සව් සිරියෙන් සපි රූ
රත්න පුර ස දිසිවේ පෙරදින මිතු රූ

112 නි ත් ඔද බින් ද රුපු නර නිඳු කළ පෝර න
නි ත් මන නන්ද රැඳි මුනි මැදුරද සොබ න
පො ත් ගුල් කන්ද එතැනට දකුණෙන් පෙණෙ න
ස ත් මිතු රන් ද නරඹනු මා පෙම වඩ න

113 ප න ර යස තෙදැති සව් සැපතින් උතු රු
ප ව ර මුනි සමය පිළිගත් ගුණෙනි ස රු
නි ත ර වැජඹි සිංහල නෙක නිරුමව රු
ප ත ර මෙ සිරි සර එහි නරඹනු මිතු රු

114 ප ව ර දිනිඳු හිමි නම වෙත එන බැවි න
අ ව ර දිහඹ පෙරමග බැඳි සහතොසි න
නොහැර දිලෙන ලෙලරණ දද වැලක් මෙ න
එ න ර සඳෑ වෙල පෙළ පැල දිග පෙණෙ න

115 උ දුල් මිණි රැසින් හෙබි එවෙන සසොබ න
සිලිල් පිරි සිසිල් රල රලිනි බබල න
නිමල් කළුගඟට සෙද බැස ගෙණ යෙහෙ න
සිසල් ගත දෙවුන් කරගෙණ තුටු සිති න

116 හිම කර හිමි සමන පහසට නිසඹ තො ස
තුරුබර කුසුම් හෙව සරසන ගහන ග ස
මන හර සපරගමු වෙහෙරට නොවී ල ස
මඹි තුර තුඹුරුවන් පුදනුව වඳු සතො ස

117 පු න් සිසි සදිසි වන නිළු පුල් යුන තුව න
ම න් නද පිළිම ගෙඩැතුළ බබලන කල න
ස න් තොසවම ගොයුම් මුනි දසන කළමෙ න
තු න් සිත පැහැද උදු හිමි පිළිම බැස ගෙ න

118 රැ ස් ව නොයෙක දෙස නෙක දනගණ තොහි ම
තොස්ව බලා සිරි රහ මඩලෙහි බැර ම
ල ස් ව සුරඹ ලෙස රඟ දෙන නළඹ හැ ම
හ ස් ව බලන් සකියනි සිට සිතුසේ ම

119 කු සු ම න් ගවසමින් මුහුලස සරා ගෙ න
ව ය මි න් කියන රස ගි පද ගලපමි න
ලෙල ලමි න් දෙයන් පියසුරු සිහිනිඟ සොබ න
පා ල බු න් රඟන දැක ලබ පලලන් නුව න

120 ලෙලදෙන රැලි පෙළින් සැදී නරුබර උකු ල
තා බ මි න සරණ නදකාර සල ඕද මෙවු ල
රුසි රෙන සුරලියන් සිරි දැරු නලඹ කැ ල
රඟ දෙන රඟ නරඹ සකි සද නොව කුහු ල

121 ලපෙ මි න් නෙදෙස නලමුලු රැස්වී නොම ද
මෙ ව න් රැගුම් නිසිලෙස කර නැවතී ස ද
කැ ලු මි බරින් දිලිහෙන මැදුරනට වැ ද
ස ම න් සුපිඳු දකු සිතු ලෙද මා සබ ද

122 වි රි ඳු සතුරු සමුදුර විඝලන නැබ ල
දිනි ඳු බදු නෙදැති දිය පතළ යුග කෙ ළ
සුරි ඳු යසම ලොව තුළ එකලෙස පත ල
ප සි ඳු වතක්කොඳ උවමට හිලෝන ල

123 මුනි සඳ උරඟ යුද සනහනු වස්පව ර
වැඩි සඳ මෙලක සතොසින් යැද වැඩම ක ර
සි රි පද පිහිටුවා සමනල ගිර පත ර
කර පුද නමකරණ සහ පිරිවර නිත ර

124 හිම කර සොමි ගුණෙන් පසුකළ දිරි සුනෙ ර
මන හර කුළුණු බර රුවි නග මෙසුර ව ර
ම මිතුර සත සිතැඟි සිදුකරදෙන පව ර
සුර තුර විලස බබලයි ලොවතුර නිත ර

125 ප ත ර එසිරි පද පුද කරණුව යතෙ න
වි ත ර නොවන දනගණ රැකගෙණ යෙහෙ න
නිත ර පැහැද වැජඹෙන යුතු අනු හසි න
ප ව ර මෙසුරවර ගුණ කවරෙක් වණ න

126 මෙවන් නොහිමි යස නෙද විකුමෙන් නැබ ල
ස ම න් සුරිඳු රැකලෙව් සාසන නිම ල
සුපු න් සරා සඳමෙන් ලකා ගුවන්ත ල
අසු න් අරා වැඩලන් සඳෙහි මනක ල

127 මුනි සිරි පා  නමදින මොක් සැපට අ  ම
තෙදබලපා  දින් රුපු ඔද හළ බැර  ම
සිරි සර පා  සර එසුරිඳු සඳ මිහි  ම
කාරුණි පා  මෙහසුන සැලකරනු පෙ  ම

128 නොමඳ  රුපු අරණ හලුකල තෙදගවැ  ද
ස ර ද  සඳ සදිසි සුර සබ කිරි මුහු  ද
නි බ ද  ලෙව් සසුන් වැඩ වැඩු මැති පැහැ  ද
සැ ර ද  සුමන දෙව්රද දියට ඇස බ  ද

129 නි මා  තොවන යස තෙද මහිමෙන් උතු  රැ
අ මා  නිවන් ගැණ මුනි දම්කල ඇසි  රැ
පෙ මා  සිතින් ලෙව් රැකි ගුණ ගණ මහ  රැ
යොමා  සවන් අස සුරිඳුනි මේ තොර තු  රැ

130 ප ස න් කැලුම්  බර කුලඹර සඳ ලෙසි  න
නැණි න් දි ලු ම්  යස කිරණව තරඟමෙ  න
නි ති න් උ තු ම්  තෙරුවන වෙත බැති දිවූ  න
මු හ න් දි ර ම්  මැති ඩී. පී. ගුණවඩ  න

131 ප ව ර  මෙමැති සඳ ගුණ ගණ මිණි නිද  න
බැහැර  සියලු උවදුරු සිරිකර දිවූ  න
නිත ර  සිතැඟි සැම සැප සලසා ලම්  න
මි තු ර  යෙහෙන් රකිනුව අයදින් බැති  න

132 මෙ සේ යෙහෙන්  යැද යලි මා මිතුරු ස  ද
නොසේ සි. ති න්  වැජඹෙන මහිමෙන් නොම  ද
වි සේ ස ව න්  ගුණයෙන් පිරි එසුර ර  ද
මෙ සේ කි ය න්  මෙපවත සිරිපද නැම  ද

133 ර න් හ සතු ල්  සුදිලෙන කුල කමලක  ර
පු න් සි සි තු ල්  ගුණ ගණ දිසි දිගු පැති  ර
බ න් දි ගු ක ල්  ගෙලාසස හර සුපැහැස  ර
දෙන් මනු වෙල්  සිටුනා මුදලිදු පව  ර

134 සත තින  අසිටු සැම උවදුරු දුරලම්  න
දින දින  කලණ සැම සැප ලංකාර දෙම්  න
සම ගි න  පියඹ පියසුත ආසිරි තිලි  න
යස සි ඩා  සුතුව රකිනුව අයදින් කල  ණ

135 සු ර වි රු  පද නැමද ඉඳ පසෙක අනතු  රු
සොහොයුරු  මෙමා සමගින් සිතු සෙ නිරතු  රු
ක ර දු රු  සියළු උවදුරු යසසින් උතු  රු
ම මි තු රු  යදින් රකිනුව සිරිදී සොඳු  රු

136 සි ත න  පමණකින් රිසිදැන ඔවුන් ඇ  ති
මු ද න  ලෙවන් රෝදුක් පොකුරඹෙවි නි  ති
ප න න  මෙමන් අදහස සලසනුව බැ  ති
යෙහෙන  යදින් නැවතද වැද එසුරප  තී

137 එ සු ර තු ම න්  යැද මෙවිලස එවෙත ඇ  ති
සක ල සු ර න්  යස තෙද බල විකුම් යු  ති
නැමද තු වි න්  රකිනුව වඩවමින් බැ  ති
සකි මෙහ සුත්  සැලකර මා වඩන රු  ති

128 මෙතතු සි ති න්  ගෙණ පෙර පසු, බස සිය  ල
ම සි තු ලෙ සින්  සිදුකර අදහස විපු  ල
තු සි තු ලෙ සින්  ලැබ ලැබ සිරි සියළු ක  ල
ප ව තු සි ය න්  සහ ම සබඳ වන සැවි  ල

139 ස ම නැ ස  මුනිඳු සඳ පිරිනිවනට පිවි  ස
දෙ ද හ ස  සිවි සියස සමගිනි දෙසාලි  ස
ල ද ව ස  දුරුතුමස පුරපස ගුරු දව  ස
සහ තො ස  මිතුරු උතුමෙකු යැදියෙන් වෙසෙ  ස

140 ද ස බු ල්  සරණ නිරතුරු සෙවි පින් කැම  ති
සු වි ස ල්  වෙද සතර කවි සතදත් නැණැ  ති
දනියෙල්  පෙරේරා විජේරුවන නම් යු  ති
සුනි ම ල්  වනසැවුල් මෙහසුන යෙදි රසැ  ති

නි මි.